# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - (පළමු සෙමෙස්තරය) – 2017/2018

## PSC 3150 – දේශපාලන විද්‍යා ක්‍රමවේදය සහ ප්‍රවේශ

**කාලය: පැ දෙකයි (2)**

ප්‍රශ්න **තුනකට (03)** පමණක් පිළිතුරු සපයන්න.
එක් ප්‍රශ්නයකට උපරිම ලකුණු **විස්සකි (20)**.

---

01.

a. දේශපාලන විද්‍යා පර්යේෂණ වලදී භාවිතා වන ආයතනික ප්‍රවේශය (Institutionalist approach) විස්තර කරන්න.

b. සාම්ප්‍රදායික ආයතනික ප්‍රවේශය විවේචනය කරන්නන් එහි වපසරිය සහ ක්‍රමවේදයෙහි අඩුපාඩු දක්වයි. එම අඩුපාඩු විස්තර කරන්න.

02.

a. දේශපාලන හැදෑරීමට ප්‍රවේශයක් තෝරා ගැනීමේදී විද්‍යාවේ දර්ශනවාදය කොතරම් දුරට වැදගත් වන්නේද? ඔබේ පිළිතුර උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

b. මනෝමූලික ඥානමීමංසාත්මක (subjectivist epistemology) පදනමක සිට අධ්‍යයනය කළ හැකි දේශපාලන ප්‍රපංචයකට උදාහරණයක් සපයන්න. ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

03.

a. විද්‍යාත්මක ක්‍රමවේද භාවිතයෙන් දේශපාලන හැදෑරිය හැකිද? පැහැදිලි කරන්න.

b. දේශපාලන විද්‍යාවේ භාවිතා වන චර්යාවාදී ප්‍රවේශය (Behavioural approach) සාකච්ඡා කරන්න.

c. විද්‍යාත්මක ක්‍රමවේද භාවිතයෙන් සිදුකළ පර්යේෂණයකට උදාහරණයක් සපයා එහිදී භාවිතා කරන ලද ප්‍රවේශය පැහැදිලි කරන්න.

04.

a. ස්ත්‍රීවාදීන්ට අනුව 'පෞද්ගලික යනු දේශපාලනික වේ'. පැහැදිලි කරන්න.

b. දේශපාලන විද්‍යාවේ භාවිතා වන ස්ත්‍රීවාදී ප්‍රවේශය සාකච්ඡා කරන්න.

c. ස්ත්‍රීවාදී ප්‍රවේශය භාවිතයෙන් කළයුතු පර්යේෂණයකට උදාහරණයක් සපයන්න.

( අ.පි.බ. )

05.

a. තාර්කික වරණවාදීන් (Rational Choice Theorists) මානව හැසිරීම පිළිබඳ සිදුකරන මූලික උපකල්පන මොනවාද?

b. ලංකාවේ ඡන්දදායක හැසිරීම අධ්‍යයනය කිරීම සඳහා තාර්කික වරණ ප්‍රවේශය කෙසේ වැදගත් වන්නේ දැයි සාකච්ඡා කරන්න.

c. තාර්කික වරණ ප්‍රවේශයට එල්ල වී ඇති ප්‍රධානම විවේචන මොනවාද?

06. පහත මාතෘකා වලින් දෙකක් තෝරා ඒවායෙහි සත්භාවවේදී සහ ඥානමීමංසාත්මක ස්ථාවරයන් (ontological and epistemological positions) පැහැදිලි කරන්න.

a. මාක්ස්වාදී ප්‍රවේශය (Marxist approach)

b. අර්ථකතන ප්‍රවේශය (Interpretive approach)

c. ස්ත්‍රීවාදී ප්‍රවේශය (Feminist approach)

d. ආයතනික ප්‍රවේශය (Institutionalist approach)

************************